# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

### 2020 පෙබරවාරි - අප්‍රේල්

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රතිබිම්බ කලා

### ප්‍රතිබිම්බ කලාව පිළිබඳ හැඳින්වීමක් IMAT E - 1015

ඕනෑ ම ප්‍රශ්න පහ(05)කට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. "ප්‍රතිබිම්බ කලාව වාර්තාකරණ මාධ්‍යයක්, ස්වාධීන කලාවක් සේ ම අන්‍ය කලා මාධ්‍යයන්හි ප්‍රගමනයට උරදෙන්නක් ද වේ." මෙම අදහසෙහි යුක්ති යුක්ත භාවය විමසන්න.

2. කැමරාවේ මූලධර්මය පැහැදිලි කොට, පෙට්ටි කැමරාව (Box Camera) අංකිත ඒක කාච ප්‍රතිඡායා (DSLR) කැමරාව බවට පරිණාමනය වීමේ දී ඊට එක් කෙරුණු වර්ධනීය අංග 10 ක් ඒවායේ කාර්යබද්ධ අවශ්‍යතා සමගින් ලියා දක්වන්න.

3. ඡායාරූප ශිල්පියෙකුට අවශ්‍ය වනු ඇතැයි ඔබ අදහස් කරන කාච වර්ග 05 ක් ඒවායේ විශේෂතා ද සමගින් හඳුන්වා දෙන්න.

4. මානනය (Aiming), නාභිගතකිරීම (Focusing), අනාවරණය (Exposing) යන මූලික කාර්යයන් හඳුන්වා දී , ඡායාරූපයක අර්ථ සම්පාදනය සඳහා ඒවා අදාළ වන ආකාරය අභිමත නිදසුන් ඇසුරින් විග්‍රහ කරන්න.

5. විද්‍යුත් ක්ෂණිකාලෝක එල්ලයෙහි (Electronic Flash Gun) මූලධර්මය පැහැදිලි කොට, එය සෙසු ආලෝක ප්‍රභවයනට වඩා ඡායාරූප ශිල්පීන් අතර ජනප්‍රිය වීමට හේතු ඉදිරිපත් කරන්න.

6. කෙටි සටහන් ලියන්න.
   - i ) කයිනටස්කෝප්
   - ii) රාජකීය වික්‍රමය
   - iii) කැලිසේයාව (Silhouttee)
   - iv) රූප ඛණ්ඩය (Shot)
   - v ) ආචාර්ය ධර්මසේන පතිරාජ

7. ඩී. ඩබ්. ග්‍රිපිත්ගෙන් සහ ජෝර්ජ් මෙලීස්ගෙන් මුල්කාලීන සිනමාවේ වර්ධනය සඳහා ලැබුණු දායකත්වය අගය කරන්න.

8. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදයන්හි පුළුල් භාවය හේතුවෙන් එය වඩාත් ඵලදායී සමාජ මෙහෙවරක් උදෙසා යොදාගැනීමට අවකාශය සැලසී ඇත් දැයි පරීක්ෂා කරන්න.

******************************